12(1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021-02-18 |

පැමිණිලි පාර්ශවය : ඩී.එච්.පී. කෞෂල්‍යා මිය.
වලවැත්ත.
තෙල්වත්ත.

වගඋත්තර පාර්ශවය : 01. ස්ථානාධිපති.
පොලිස් ස්ථානය.
මීටියාගොඩ.

02. උ.පො.ප. ශ්‍රේෂන් මහතා.
පොලිස් ස්ථානය.
මීටියාගොඩ.

පැමිණිලි අංකය : **HRC/2785/17**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම ස්වාමි පුරුෂයා වන එන්.එච්. චමිත් ලක්ෂාන් යන අය සහ තමා 2017.08.21 වන දින රාත්‍රී 7.20 ට පමණ යතුරු පැදියකින් ගමන් කරමින් සිටියදී පොලිස් නිලධාරීන් කණ්ඩායමක් විසින් යතුරු පැදියට අත දැමූ බවත්, එය නොදැකීම නිසා ඉදිරියට යනවිට පොලිස් නිලධාරියෙකු යතුරු පැදියේ හැඬලයේ එල්ලුනු බවත්, එවිට පැමිණිලිකාරිය හා ස්වාමි පුරුෂයා ඇද වැටුනු අතර, තම ස්වාමි පුරුෂයා හෙල්මට් පැළද සිටි බවත්, තමා හෙල්මට් පැළඳ නොසිටි බවත්, ඉන්පසුව පොලිස් නිලධාරීන් විසින් මාංචු දමා තම ස්වාමි පුරුෂයාව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්ය.

රාත්‍රී 8.10 ට පමණ පැමිණිලිකාරිය ස්වාමි පුරුෂයා බැලීමට මීටියාගොඩ පොලිස් ස්ථානයට ගිය අතර, ස්වාමි පුරුෂයා පොලිස් සිර මැදිරියේ සිටි බවත්, පැමිණිලිකාරිය ඔහු සමග කථා කරන අවස්ථාවේදී ස්වාමි පුරුෂයාගේ මළුව පුපුරන්න තරමට වේදනාවක් ඇති බවට තමා වෙත ප්‍රකාශ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කළ බවත්, ඒ බව තමා උපසේවා නිලධාරියාට දැනුම්දුන්නද, ඔහු බැණ වදිමින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවත්, පසුව පසුදින තමා පොලිස් ස්ථානයට ගොස් බලනවිට ස්වාමි පුරුෂයා පොලිස් ස්ථානයේ නොසිටි අතර, ඔහුව කරාපිටිය රෝහල වෙත ගෙන ගොස් තිබූ බවත්, රෝහලෙන් ශල්‍යකර්මයක් කර තිබූ බවත්, පසුව 2017.09.03 වන දින තම ස්වාමි පුරුෂයා මියගිය බවත් සඳහන් කර ඇත. තමා රෝහලේ වෛද්‍යවරු හමුවූ අවස්ථාවේදී පැය දෙකකට පෙර ඔහුව රෝහලට ඉදිරිපත් කර තිබුනේ නම් ස්වාමි පුරුෂයාගේ ජීවිතය බේරා ගැනීමට හැකියාව තිබූ බවට වෛද්‍යවරුන් තමා සමග ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකාරිය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තමා ස්වාමි පුරුෂයාව රෝහලට රැගෙන යන ලෙසට ඉල්ලීම් කළද, පොලිස් නිලධාරින් එම ඉල්ලීමට කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීම නිසා ස්වාමි පුරුෂයාගේ මරණය සිදුවූ බවත්, එසේම මෙම මරණය සම්බන්ධයෙන් තම ස්වාමි පුරුෂයාට පහරදී ඇත්ද යන්න පිළිබඳව තමාට සැකයක් පවතින බවත්ය.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

පැමිණිල්ලේ 01 වන වගඋත්තරකරු ලෙස නම් කර තිබූ උ.පො.ප. ජනක මහතා කොමිෂන් සභා පරීක්ෂණ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටියේ, තමා පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා අත්අඩංගුවට ගැනීම, ප්‍රශ්න කිරීම හෝ රෝහල් ගත කිරීමක් සිදු නොකළ බවයි. මෙම පුද්ගලයාව අත්අඩංගුවට ගෙන ඇත්තේ උ.පො.ප. ශ්‍රේෂන් නමැති නිලධාරියා බවද 2017.10.17 වන දින පැවති විමර්ශනයේදී ප්‍රකාශ කර ඇත.

උ.පො.ප. ජනක නිලධාරියාගෙන් වැඩිදුරටත් කරුණු විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ, 2017.08.21 වන දින තමා වැටලීම් රාජකාරියකට ගොස් එන අවස්ථාවේදී මීටියාගොඩ පොලිස් ස්ථානයේ පොලිස් ජීප් රථය නවතා තිබූ බවත්, එම ස්ථානයේ උ.පො.ප. ශ්‍රේෂන් ඇතුළු නිලධාරින් සිටි බවත්, "අණ නොතකා ධාවනය කළ යතුරු පැදියක් නිසා පොලිස් නිලධාරියෙකු අනතුරුට පත් වූ බවත්, යතුරු පැදිය ධාවනය කළ පුද්ගලයා පොලිස් රථයේ සිටින බවත්" ඔවුන් තමා වෙත ප්‍රකාශ කළ බවත්ය. පසුව තමා ජීප් රථය ළගට ගොස් බලනවිට එම පුද්ගලයා චමිත් ලක්ෂාන් බව හඳුනාගත් බවට සඳහන් කර සිටින අතර, එම අය බල අපරාධ අංක : 2820/17 යටතේ රන් ආභරණ හා මුදල් සොරකම් කිරීමේ සිද්ධියකට සොයන සැකකරුවෙකු බවද, මෙම අය ප්‍රදේශය මගහරිමින් සිටි අයකු වන අතර ඔහුව තමා හඳුනන බවද සඳහන් කර ඇත. එසේම එම අයගේ සහෝදරයා වන වංචල ජයසිංහ යන අය හෙරොයින් ලග තබා ගැනීම සම්බන්ධයෙන් දැනට බන්ධනාගාර ගත කර ඇති අයෙක් බවත්, අනෙක් සහෝදරයා වන චරිත් හෂිත් 2017.03.09 වන දින හෙරොයින් සමග තමා අත්අඩංගුවට ගෙන ඇති බවත්, අධිකරණයෙන් වරදකරු වී රු. 7,500/- ක දඩයකට යටත් කළ බවත්, මොවුන් නීති විරෝධී කටයුතු වල යෙදෙන අය බවත් සඳහන් කර ඇත.

තවද, එම අත්අඩංගුවට ගැනීම් තමා විසින් කර ඇති නිසා තමා සමග මෙම අය පෞද්ගලික තරහක් පවතින බවත්, එම හේතුව මත තමාව මෙම පැමිණිල්ලේ වගඋත්තරකරුවෙකු බවට පත් කර ඇති බවත් සඳහන් කර ඇත.

2018.03.26 වන දින විමර්ශනය සඳහා මියගිය අය අත්අඩංගුවට ගත් පො.ප. ශ්‍රේෂන් යන අය හා 2017.08.21 වන දින මීටියාගොඩ පොලිස් ස්ථානයේ උපසේවයේ රාජකාරි කළ පො.කො. 43574 එල්.යූ. දීප්ති යන අය වගඋත්තරකරුවන් ලෙස කොමිෂන් සභාව වෙත කැඳවා ඇත.

02 වන වගඋත්තරකාර පො.ප. ශ්‍රේෂන් මහතාගේ ප්‍රකාශය :-

අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකළ නිලධාරියා වන පො.ප. ශ්‍රේෂන් මහතා විසින් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, තමා 2017.08.21 වන දින ස්ථානාධිපතිගේ නියෝග පරිදි පැය 18.00 සිට පසුදින පැය 6.00 දක්වා රාත්‍රී ජංගම රාජකාරියේ පො.සැ.රි. 1474 රම්‍යසිරි නිලධාරියා විසින් පදවනු ලබන WP LM 5956 දරණ කැබ් රථයෙන් පො.කො. 90254 කුමාර යන නිලධාරියා සමග ජංගම සංචාරයේ රාජකාරියේ යෙදී සිටි බවයි. ස්ථානාධිපතිතුමාගේ නියෝග පරිදි පැය 20.00 ට පැය 21.00 දක්වා වලකඩ ප්‍රජා ශාලාව අසල පිහිටි බුදු පිළිමය අසල මාර්ග බාධක රාජකාරියේ යෙදී සිටි අතර, ඒ අනුව වාහන පරීක්ෂා කිරීමේ රාජකාරියේ යෙදී සිටියදී තෙල්වත්ත දෙස සිට කිරිදිවැල දෙසට අධික වේගයෙන් ධාවනය කරමින් තිබුණු WP DFC 7935 යමහා වර්ගයේ MZ යතුරු පැදියට විදුලි පන්දම් එළිය දක්වා පොලිස් නලාවද නාද කර එම යතුරු පැදිය නතර කරන ලෙසට පො.කො. 90254 දරණ නිලධාරියා සංඥා කළ නමුත් එම යතුරු පැදිය නොනවත්තවා ධාවනය කළ බවත්, යතුරු පැදිය පොලිස් නිලධාරියාගේ ඇගේ හැපී යතුරු පැදිය හා පැදිකරු ඇදවැටුනු බවත්, මෙහිදී යතුරු පැදිකරුට බාහිර තුවාල කිසිවක් දක්නට නොතිබූ අතර පොලිස් නිලධාරියාගේ තොල පෙදෙස සීරී තිබූ බවත් සඳහන් කර ඇත. පසුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව බල අපරාධ 2820/17 යටතේ අත්බෑගයක තිබූ රන් ආභරණ හා අත් ඔරලෝසු, ජංගම දුරකථනයක් හා වෙනත් ලියකියවිලි සොරකම් කිරීමේ වරදට අවශ්‍ය වූ සැකකරුවෙකු බව අනාවරණය වූ බැවින් චමිත් ලක්ෂාන් යන අයව පැය 20.45 ට අත්අඩංගුවට ගෙන මීටියාගොඩ පොලිස් ස්ථානයේ උපසේවයේ රාජකාරියේ සිටි පො.කො. 43574 දීප්ති යන නිලධාරියාට භාරදුන් බවත්, තුවාල වී සිටි 90254 කුමාර නිලධාරියාව ස්ථානයේ රඳවා පො.කො. ගුණසිංහ යන නිලධාරියා සමග නැවත ජංගම රාජකාරියේ යෙදුනු බවත් සඳහන් කර ඇත.

පසුව උපසේවයේ රාජකාරියේ යෙදී සිටින අතරතුරදී උපසේවා නිලධාරියා තමාගේ පුද්ගලික දුරකථනයට කථා කොට රඳවා සිටින චමිත් ලක්ෂාන් යන අයව රෝහලට රැගෙන යන ලෙසට දැන්වූ අතර, තමා නැවත ස්ථානයට පැමිණ සැකකරුව බටපොල රෝහලට රැගෙන ගිය බවත්, පසුව පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගිලන් රථයෙන් බලපිටිය රෝහලට රැගෙන ගිය අතර, පසුව එම

රෝහලෙන් කරාපිටිය රෝහලට ඇතුළත් කළ බව ද, එම අයගේ ආරක්ෂාව සඳහා පො.කො. 12038 රාජකරුණා නිලධාරියා ස්ථානාධිපතිගේ නියෝග අනුව යෙදවූ බව ද ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරුගෙන් වැඩිදුර කරුණු විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ, 20187.08.21 වන දින වලකඩ ප්‍රජා ශාලාවේ බුදු පිළිමය අසල තුන්මංහන්දියේ මාර්ග බාධකය සාමාන්‍ය මාර්ග බාධකයක් බවත්, මෙම පුද්ගලයාව අත්අඩංගුවට ගැනීම සඳහා පමණක් යොදන ලද එකක් නොවන බවත්ය. අදාළ සිද්ධිය එදින පැය 20.30 ට පමණ සිදුවූ බවත්, එහිදී එහි රාජකාරි කළ නිලධාරියා වන පො.කො. 90254 කුමාර යන නිලධාරියාට සුළු තුවාල සිදුවූ බවත්, ඔහු පසුදින බලපිටිය රෝහලේ ශල්‍ය කර්මයකටද භාජනය කළ බවත් ප්‍රකාශ කර ඇත.. එම අවස්ථාවේදී සැකකරුගේ බාහිර තුවාල කිසිවක් නොතිබූ බවද සඳහන් කර ඇත.

**03 වන වගඋත්තරකාර පො.කො. 43574 එල්.යූ.දීප්ති යන අයගේ ප්‍රකාශය :-**

පො.කො. 43574 එල්.යූ .දීප්ති යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, 2017.08.21 වන දින සවස පැය 18.00 සිට පසුදින එනම්, 2017.08.22 වන දින උදෑසන 6.00 දක්වා උපසේවක රාජකාරියේ යෙදී සිටි බවත්, පො.ප. ග්‍රේෂන් මහතා විසින් ඉදිරිපත් කරන ලද චමින් ලක්ෂාන් යන අය සහ ඔහු පදවන ලද SP DFC 7975 දරණ යතුරු පැදියද භාරගත් බවත්, සැකකරුව පරීක්ෂා කර සිර මැදිරිය වෙත දැමූ බවත්, පරීක්ෂා කිරීමේදී කිසිදු තුවාලයක් නොතිබූ බවත්ය. ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය බවට ඔහු ප්‍රකාශ නොකළ බවත්, පැය 22.30ට සිර මැදිරිය පරීක්ෂා කර නැවත රාත්‍රි 12.30ට පරීක්ෂා කළ අතර, සැකකරු ආහාර ගෙන නිදාගෙන සිටි බවත් සඳහන් කර ඇත. පසුව රාත්‍රියේ 9.30ට පමණ මෙම සැකකරුගේ බිරිඳ පොලිසියට පැමිණි අතර සැකකරු බැලීමට හා ආහාර ලබාදීමට ඉඩ ලබාදුන් බවත්, අළුයම 2.10 ට පමණ සැකකරු කෙඳිරි ගාන බවට ඇසුනු නිසා පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයාට දුරකථනයෙන් දැනුම්දුන් දී ස්ථානාධිපතිගේ උපදෙස් පරිදි රාත්‍රි ජංගම සේවයේ යෙදී සිටි පො.ප. ග්‍රේෂන් මහතාට දැනුම්දීමෙන් පසුව සුළු වේලාවකින් ඒ මහතා පොලිස් ස්ථානයට පැමිණි පසු අදාළ සැකකරුව සිර මැදිරියෙන් එළියට ගෙන ප්‍රශ්න කිරීමක් හෝ කටඋත්තරයක් ලබාගැනීම සිදු නොකර රෝහල වෙත රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. තවද, පැමිණිලිකාරිය ස්වාමි පුරුෂයාට අසනීප බවට තමා වෙත දැනුම්දුන් බවට කරන ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන බවද ප්‍රකාශ කර ඇත.

මියගිය අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එහි මරණයට හේතුව වශයෙන් දක්වා ඇත්තේ,

(1) හිසට සිදුවූ සංවෘත්ත තුවාලය

(2) මාර්ග රිය ගැටුමක්

(3) අසමතුලිතතාවය ලෙස දක්වා ඇත.

අදාල මරණය සම්බන්ධයෙන් බලපිටිය මහේස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂණයක් සිදුකර ඇති අතර. නඩු අංක 4098/17 යටතේ පැමිණිලිකාරිය අධිකරණයේදී ප්‍රකාශයක් ලබාදී ඇත. එහිදීද සඳහන් කර ඇත්තේ. 2018.08.21 වන දින සිද්ධිය සිදුවූ බවත්. පසුව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්. පොලිස් ස්ථානයේ දී තමා ස්වාමි පුරුෂයා සමග කතා කල බවත්. එහිදී ඔහුට අධික ලෙස හිස කැක්කුමක් ඇති බවට තමා වෙත ප්‍රකාශ කල බැවින් තමා ඒ බව උපසේවා නිලධාරියාට දැනුම්දී ස්වාමි පුරුෂයාව රෝහලක් වෙත රැගෙන යන ලෙසට ඉල්ලීමක් කල බවත්. එවිට උපසේවා නිලධාරියා පැනඩෝල් දෙකක් ලබාදෙන ලෙසට ප්‍රකාශ කල බවත්ය.

නිරීක්ෂණ :-

පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා වන චමින්ත් ලක්ෂාන් යන අයව 2017.08.21 වන දින පැය 21.20 ට පමණ අත්අඩංගුවට ගෙන ඇති අතර. එම අවස්ථාවේදී යතුරු පැදියෙන් බිම ඇද වැටී ඇති බවත් නිරීක්ෂණය වේ.

අනතුරුව එම පුද්ගලයාව පොලිස් ස්ථානයට රැගෙන ගොස් උපසේවයට භාරදී ඇත.

පැමිණිලිකාරිය තම ස්වාමි පුරුෂයාට අධික හිස කැක්කුමක් ඇති බවට උපසේවක වෙත දන්වා ඇති බවට ඇය විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති පැමිණිල්ලෙන් සහ අධිකරණය ඉදිරියේදී කරන ලද ප්‍රකාශය මගින් තහවුරු වේ. පැමිණිලිකාරිය බලපිටිය මහේස්ත්‍රාත්තුමාට කරන ලද ප්‍රකාශයේදී තම ස්වාමි පුරුෂයාට ශල්‍යකර්මයක් කල බවට ඇය නොදන්නා බවට ප්‍රකාශ කර ඇත. තවද. පැමිණිලිකාරිය ගරු මහේස්ත්‍රාත්තුමා ඉදිරියේදී තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ. තමා 2017.08.21 වන දින රාත්‍රියේ පොලිසියට ගිය අවස්ථාවේදී පොලිසියේ නිලධාරින්ගේ අවසර මත ස්වාමිපුරුෂයා සමග කථා කල බවත්. එම අවස්ථාවේදී තමාගේ ඔළුව පුපුරන්න එනවා වගේ යනුවෙන් ඔහු තමා වෙත ප්‍රකාශ කල බවත්. ඉන්පසුව පැමිණිලිකාරිය පොලිස් ස්ථානයේ උපසේවයේ සිටි නිලධාරියාට ස්වාමිපුරුෂයාට අමාරු බවත්. රෝහලට රැගෙන යන ලෙසත් ප්‍රකාශ කල බවද සඳහන් කර ඇත.

නිගමනය :-

අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු අත්අඩංගුවේ සිටින කාලය තුළ ඔහුගේ පූර්ණ ආරක්ෂාව සැපයීමට අදාල පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් කටයුතු කල යුතුය. පැමිණිලිකාරිය තම ස්වාමි පුරුෂයාට අධික හිස කැක්කුමක් ඇති බවට උපසේවා නිලධාරියාට දැනුම්දී තිබුණද. ඒ සම්බන්ධයෙන් ඔහු නිසි සැලකිල්ලක් දක්වා නොමැති බව ඉදිරිපත් වී ඇති කරුණු අනුව තහවුරු වේ.

මියගිය අයගේ බාහිර තුවාල නොතිබූ බවට නිරීක්ෂණය වී ඇති අතර. එවැනි තුවාලයක් තිබූ බවට පැමිණිල්ලේද සඳහන් නොවේ. නමුත්. හදිසි අනතුරක් සිදුවීමෙන් පසුව සැකකරුවෙක් අත්අඩංගුවට

ගැනීමෙන් අනතුරුව ඔහු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම අත්අඩංගුවේ තබා ගන්නා නිලධාරීන් විසින් දැරිය යුතු වේ. පොලිස් නිලධාරීන් විසින් අවශ්‍ය ප්‍රතිකාර ලබාදීමට කටයුතු නොකිරීම තුළින් හා නොසැලකිලිමත්කම හේතුවෙන් ප්‍රස්තුථ කාරණය උද්ගත වී ඇති බව නිරීක්ෂණය වේ.

පොලිස් දෙපාර්තමේන්තු නියෝග වල අංක : ඒ 20 දරණ දෙපාර්තමේන්තු නියෝග යටතේ "පොලිසියේ ආරක්ෂාව භාරයේ සිටින තැනැත්තෙක් පිළිබඳ නීතිරීති වල. පොලිසිය සතු යුතුකම් හා අත්අඩංගුවේ සිටින අයගේ අයිතිවාසිකම් යටතේ "සිර භාරයේ සිටින තැනැත්තෙකු වරදක් කරනු ලැබූ සිරකරුවෙකුගේ තත්ත්වයේ සිටින්නෙකු නොවන බවත්. ආරක්ෂක භාරය ගැන සලකා ඔහු ගැන සෑම අතින්ම සැලකිලිමත්විය යුතු බවත් සෑම පොලිස් නිලධාරියෙකුම මතක තබාගත යුතු බවට දක්වා ඇත. ඉදින් සිර භාරයේ සිටින තැනැත්තෙකු කෑමබීම, සායන ආදි විශේෂ පහසුකම් ඉල්ලා සිටියහොත් එම ඉල්ලීම ගැන ඉතා ඕනෑකමින් සලකා බැලිය යුතු අතර. ඒ සම්බන්ධයෙන් කාර්ය භාර නිලධාරියාගේ උපදෙස් සෙවිය යුතුය. ආරක්ෂක භාරයට හානියක් නොවූවොත් එම කාර්ය භාර නිලධාරියා එම පහසුකම් සැලසිය යුතුය." වශයෙන් දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය විසින් සිර භාරයේ සිටින තම ස්වාමියාට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය බවට ඔහු ඉල්ලා සිටින බවට දන්වා ඇතත්. ඒ සම්බන්ධයෙන් උපසේවා නිලධාරියා කටයුතු නොකිරීම තුළින් පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඔහු විසින් උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව අනුව සෑම පුරවැසියෙකුටම නීතියේ ආරක්ෂාව ලැබීමේ අයිතිය ඇති අතර. පොලිස් දෙපාර්තමේන්තු නියෝග අනුව සැකකරුවෙකුට යම් ප්‍රතිකාරයක් අවශ්‍ය නම් එය ලබාගැනීමට අයිතියක් ඇත. එම අයිතිය දෙවන වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

01. මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමුකරනු ලබන අතර. දෙවන වගඋත්තරකරු සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. තවද, දෙවන වගඋත්තරකරු විසින් මියගිය අයගේ බිරිඳට රු. 50,000/- ක වන්දි මුදලක් ලබා දීමටද කටයුතු කළ යුතුය.

2021.03-18 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මහාචාර්ය නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත =: 01. පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

02. සභාපති.
ජාතික පොලිස් කොමිෂන් සභාව.
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව.
කොළඹ 08.

සැ.යු =: අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.

B/H